www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මයිකල් මුවර්ගේ ප්‍රතිපදානය

## ෆැරන්හයිට් 9/11, තිර රචනය සහ අධ්‍යක්ෂනය මයිකල් මුවර් විසිනි.

**Michael Moore's contribution**

**ඩේවිඩ් වෝල්ෂ් විසිනි**
**2004 ජුනි 30**

මයිකල් මුවර්ගේ ෆැරන්හයිට් 9/11 චිත්‍රපටය මුදා හැරීම මගින්, එක්සත් ජනපදයේ සුවිසල් ජන සමූහයකට ඉරාක යුද්ධය සහ බුෂ් පරිපාලනය සම්බන්ධයෙන් තම විරුද්ධත්වය ද, දේශපාලනික හා මාධ්‍ය සංස්ථාපිතය සම්බන්ධයෙන් පොදු අතෘප්තිය ද ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවක් සම්පාදනය කෙරිනි. චිත්‍රපටය මගින් ගෙන එනු ලබන පනිවුඩය දැවැන්ත ලෙස අනුමත කරමින්, තිර ගත කෙරුනු පලමු සති අන්තය තුල, මිලියන තුනකට අධික ජනයා එය නැරඹූහ.

මුවර්ගේ චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම උතුරු ඇමරිකාවෙන් ආරම්භ කිරීම සැලසුම් කල රංගනයක් නොව අව්‍යාජ දේශපාලන සිද්ධියකි. දශක ගනනාවක් පුරා බලගතු ලෙස ආගමිකකරනය කරන ලදුව, පටු ම මග තුලින් ගලා යන නිල දේශපාලන ජීවිතයක් සහිත රටක මෙම සිද්ධිය මත් දුර්ලභ ගනයේ එකකි. බොහෝ ජනයා සඳහා, චිත්‍රපට ප්‍රවේශ පත්‍රයක් මිලදී ගැනීම තම විරුද්ධත්වය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් බවට ක්ෂනිකව ම පත් විය. නිල මිථ්‍යා ප්‍රබන්ධයට විපරීතව, එමගින් පෙන්නුම් කෙරුනේ එක්සත් ජනපදය තුල මිලියන සංඛ්‍යාත මහජනයා ආන්ඩුවේ සාපරාධී පිලිවෙත්වලට බලගතු හැඟීමෙන් යුක්තව විරුද්ධ වන බවයි.

මෙය සුලු පටු දෙයක් නො වේ. ෆැරන්හයිට් 9/11 කෙරෙහි දැක්වූ ප්‍රතිචාරය ඇමරිකානු මාධ්‍යයන් සහ එහි ප්‍රමුඛ පුද්ගලයින් පිලිබඳව කෙරුනු විනාශකාරී එලිදරව්වකි. දැවැන්ත බොක්ස් ඔෆිස් පිරිවැටුම, වෘත්තාන්තමය නොවන චිත්‍රපටයක් සඳහා පෙර නොවූ විරූවක් මගින් "යුද ජනාධිපති" සහ ඔහුගේ තන්ත්‍රයේ ජනප්‍රියතාව පිලිබඳ කතාවල පල්ල ගලවා දැමිනි. ඒබ්‍රහම් ලින්කන් නිරවද්‍යය - ඔබට සියලු දෙනා සදාකාලිකව ම රැවටිය නොහැක.

යුද්ධයට දැවැන්ත විරුද්ධත්වයක් තිබුනු බැව් මාධ්‍යයන්ට "අත හැරී ගියේ" කෙසේද? 2003 පෙබරවාරියේ සුවිසල් විරෝධතාවලින් පසුව පවා, මුවර්ගේ චිත්‍රපටය වාර්තාමය පිරිවැටුමක් ලබා එය ජාතික ජීවිතයේ ප්‍රත්‍යක්ෂ කරුනක් බැව් සනාථ වන තෙක් එය නොතකා සිටියේ සහ සඟවා තැබුවේ මන්ද? බුෂ් ප්‍රතිගාමී අපතයෙක් බව, සදාචාරාත්මක නපුංසකයෙක් බව, ඔහුගේ සෑම වචනයක් හා ක්‍රියාවක් ම සංගත ප්‍රභූවේ අවශ්‍යතාවන්ට සේවය කල බැව් "ලිබරල්" මාධ්‍ය ඇතුලු මාධ්‍යයන්ට "අත හැරුනේ" කෙසේද?

දුර දිනයක ඇඟැවුම් සහිත රැඩිකලීකරනයක් එක්සත් ජනපදය තුල වර්ධනය වන බැව් ජනතාමතයෙන් තහවුරු කෙරේ.

සිනමාශාලාවලට රැස්වූ මිලියන සංඛ්‍යාත ජනයා නිකරුනේ එහි ගියා නොවන අතර රැවැටී එහි ගියා ද නො වේ. ෆැරන්හයිට් 9/11 යනු නිශ්චිත අංශවලින් සුවිශිෂ්ඨ වන, සැලකිය යුතු සහ හදවතට දැනෙන අව්‍යාජබවකින් යුත් සිනමා කෘතියකි. මුවර් යනු අන්තර්ඥානය, ශක්තිය හා ධෛර්යය පෙන්නුම් කරන ප්‍රතිභාසම්පන්න සිනමා කරුවෙකි. කෘතියේ යථා, සහ බලගතු දුබලතා සැලකිල්ලට ගැනීමේදී පවා ඒවා නිශ්චිත සන්දර්භයක තැබිය යුතු වේ. ෆැරන්හයිට් 9/11, උදාහරනයක් ලෙස, බොහෝ ක්ෂේත්‍රයන් ආවරනය කිරීමට උත්සාහ දැරුව ද, බොහෝ ප්‍රශ්න ස්පර්ශ කලා වුව ද ඉන් කිසිවක් සම්බන්ධයෙන් සෑහෙන තරම් ගැඹුරට නොගියේ යැයි සමස්තයක් ලෙස මුවර්ට දොස් පැවරිය හැකිද? සියල්ලට පසු, එක්සත් ජනපද මාධ්‍යයන් තමන් සතු දැවැන්ත සම්පත් සහ තාක්ෂනය යොදා ගනිමින් සිද්ධීන් සම්බන්ධයෙන් අල්ප අවංක භාවයකින් කටයුතු කරද්දී එවන් හිදැසක් තනි අතින් තමාට පිරවිය හැකියැයි මුවර්ට පැහැදිලිවම සිතා ගත හැකිද? කවර හෝ නිල මාධ්‍යයක් කිසිවක් අනාවරනය හෝ පරීක්ෂා නො කරන තතු යටතේ සියල්ල ආවරනය කිරීමේ අවශ්‍යතාවක් ඔහුට මතු වේ ද?

ඔහුට තිබෙනවාය කියනු ලබන "අහම් භාවය"කට සහ "අත්තුකංසනයට" දක්ෂිනාංශික විචාරකයන් විසින් බැට දෙනු ලැබී ය. මෙම ප්‍රතිගාමීහු, වෙනත් බොහෝ මෙවන් උදවිය බිය ගැන්වී හෝ පගාවට යටවී සිටින කලෙක, චිත්‍රපටකරුවා බලවන්තයන්ව අභියෝගයට ලක් කිරීමට තරම් ගැම්මක් ඇතිව සිටීම පිලිබඳව උදක්ම වියරු වැටුනහ.

සුවිශේෂිතව, ඇමරිකානු උගතුන්ගේ ජන මාධ්‍යවේදී

අංශය සුවිශල් වසයෙන් දූෂිත භාවයේ නරා වලකි. මෑත වසරවල දී එක්සත් ජනපද මාධ්‍යයන්, එහි ආන්ඩුව හා සමාජය පිලිබඳ සත්‍යය ගවේෂනයෙන් මහජනතාව වලක්වා ලනු වස් කරුනු වසන් කිරීම තම ප්‍රධාන කර්තව්‍යය බවට පත් කර ගනු ලැබූ අතර ඒ සඳහා එහි නිර්මානශීලීත්වය සුවිසල් වසයෙන් කැප කලහ.

දස දහස් ගනනකට මරු කැඳවූ සහ මෙතෙකැයි ගනන්බැලිය නොහැකි ව්‍යසනකාරී ප්‍රතිඵල අත් කර දුන් පූර්න ආක්‍රමනකාරී යුද්ධයක් දියත් කල හැකි වූයේ එයට එරෙහිව ඇමරිකානු මාධ්‍යයන් තුල එක් ප්‍රධාන හඬක් හෝ නොමැති තතු යටතේ විනිවිද පෙනෙන බේගල් මාලාවක් මත පදනම් වෙමිනි. මෙය මාධ්‍ය අධිපතීන් සහ ඔවුනගේ කෝටිපති ආධාරකරුවන් විසින් වගකිවයුතු  අපරාධයකි.

ඩිමොක්‍රැටික් පක්ෂයෙන් බිඳී වෙන් වීම ප්‍රතික්ෂේප කිරීම, ජනප්‍රියවාදී කූටාලිකම් සහ තනි පුද්ගලයෙකු ලෙස බුෂ් සම්බන්ධයෙන් ඇති චිත්තාපරභාවය වැනි මුවර්ගේ දේශපාලන දුෂ්කරතා දැක ගත යුත්තේ අදාල සන්දර්භය තුලය. මෑත වසරවල දී එක්සත් ජනපදයේ ලිබරල් වමේ දැවැන්ත කොටසක් ධනයෙන් ආඪ්‍ය වෙමින්, දකුනට හැරෙමින් සහ ජනගහනයේ පුලුල් ස්තරයන්ගේ ඉරනම සම්බන්ධයෙන් වැඩෙන උදාසීනත්වය ප්‍රදර්ශනය කරමින් සරලවම යටත් විය. මුවර් යනු යම් ආකාරයෙක හුදෙකලා පුද්ගලයෙකි. පීඩිතයන්ගේ තත්වය සම්බන්ධයෙන් හැඟීමක් හා සැබෑ වේදනාවක් ඔහු සතු වේ.

## 2000 මැතිවරනය සහ ඉන් ඉක්බිති

මුවර් ඔහුගේ චිත්‍රපටය අරඹන්නේ බුෂ් කඳවුර විසින් 2000 මැතිවරනය කොල්ලකෑම සහ ඩිමොක්‍රැටික අපේක්ෂක අල් ගෝර් සහ ඔහුගේ පක්ෂය මෙම සොරකමට ප්‍රතිරෝධය දැක්වීම ප්‍රතික්ෂේප කිරීම වෙනුවෙන් කැප කෙරුනු රූප රාමු පෙලකිනි. බුෂ්, විරෝධතා නොතකා, ජනාධිපති තනතුරේ වැඩ භාර ගත් වහාම නිවාඩු ගනී.

නව පරිපාලනයේ ප්‍රසිද්ධ මුහුනුවල දර්ශන කීපයකින් පසුව තිරය අඳුරු වී යන අතර 2001 සැප්. 11 වන දින ත්‍රස්ත ප්‍රහාරයේ ශබ්දයන් පසුබිමෙන් ඇසේ. පහල වීදිවල සිට සිද්ධිය නරඹන්නන්ගේ තැති ගැනුනු මුහුනු අනතුරුව තිරය මත දිස්වේ. ඉක්බිති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ අත්‍යසාමාන්‍ය රූප පෙලකි. ලෝක වෙලඳ පොලට දෙවන මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාරය ද එල්ල වූ බැව් එක්සත් ජනපද ජනාධිපතිවරයාට දැනුම් දෙනු ලබන්නේ ඔහු පන්ති කාමරයක අසුන් ගෙන සිටින විට ය. ව්‍යසනය දැන ගැනීමෙන් පසුව ද ඔහු තවත් මිනිත්තු හතක් එලෙස ම වාඩි වී සිටිමින් ළමා පොතක් කියවන්නේ කලයුත්තේ කුමක් දැයි නොදන්නා මිනිසෙකු ලෙසිනි.

ත්‍රස්ත ප්‍රහාරයට සදාම් හුසේන් තන්ත්‍රයේ කිසියම් සබඳතාවක් නොතිබිය දී හා ඉරාකය කිසි දා හෝ එක්සත් ජනපදයට පහර දී නොමැති තතු යටතේ දී පවා සිද්ධියට හුසේන් තන්ත්‍රය සම්බන්ධිත බවට මහජන මතයක් නිර්මානය කිරීම සඳහා, සැප්තැම්බර් 11 ත් සමගම බුෂ් පරිපාලනය හිතා මතාම යෙදී ගත් බැව් මුවර් නිරවද්‍යව විස්තර කරයි.

චිත්‍රපටයේ විස්තාරනය කෙරුනු දසුන් පෙලක් මගින් බුෂ් පවුල සහ සවුදි පාලක ප්‍රභූව අතර පවත්නා පුලුල් - පරාසයීය සබඳතා විස්තර කෙරේ. මෙම සබඳතා යථා සහ අර්ථභාරී වන අතර චිත්‍රපටය පුරා දිවෙන පොදු තර්කනය, එනම්, එක්සත් ජනපද විදේශ පිලිවෙත ගලා එනු ලබන්නේ තෙල්, ලාභ සහ සම්පත් ගිජුකම වැනි ද්‍රව්‍යමය අවශ්‍යතාවලින් යන්න නිශ්චිත වසයෙන්ම ඉරාකය “විමුක්ත කර ගැනීම” සහ මැද පෙරදිගට “ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒම” යන මුග්ධ කථා කීතු කර දමන සෞඛ්‍යමත් ප්‍රතිවිෂකාරකයකි. නමුත් මුවර් වඩාත් සාවද්‍ය වන්නේ මේ කොටසේදී ය.

ෆැරන්හයිට් 9/11, අවශ්‍යයෙන් ම චිත්‍රනය කරනු ලබන්නේ බුෂ් පරිපාලනයේ ප්‍රධාන මෙහෙයුම්කරුවන් සහ පාලකයින් වන්නේ සවුදිවරුන් බවයි. මෙය සරලවම සාවද්‍යය. “පොහොසත් අරාබිවරුන්” රට මත ආධිපත්‍යය දරන බවට හෝ ඔවුන්ගෙන් අනවශ්‍ය බලපෑම් ඇති වී තිබෙන බවට කෙරෙන යෝජනාව එක්සත් ජනපද මහජනතාවගේ දේශපාලන විඥ්ඤානය ඉහල දැමීම සඳහා ආධාරක නොවේ. ඇමරිකානු අධිරාජ්‍යවාදය රුදුරු, සාහසික සහ විලෝපක වේ. සවුදි ධූරාවලිය කොතරම් දැවැන්ත ධනයක් හිමි කර ගෙන සිටිය ද, ස්වාධීන ක්‍රියාකාරකයකු නොවන අතර, එක්සත් ජනපද අවශ්‍යතාවන්ගේ රැකඩයෙකු සහ ඒවා රැක බලා ගන්නෙකි.

අධ්‍යක්ෂවරයා වඩාත් ප්‍රගාඪ විශ්ලේෂනයක් සම්පාදනය කරනවා වෙනුවට පහසු පැහැදිලි කිරීමකින් ප්‍රේක්ෂකයා ආකර්ශනය කරගනු වස් අවම ප්‍රතිරෝධයේ මාවත ගෙන ඇත. ෆැරන්හයිට් 9/11 හි ඒ අයුරින් කෙටි මං සෙවූ එකම අවස්ථාව මෙය නොවේ.

නල මාර්ග ගනුදෙනුවක් සඳහා එක්සත් ජනපදයට පැමිනෙන තලිබාන් නිලධාරීන්ගේ හෙලිදරව්කාරී දර්ශන ද අන්තර්ගතව සැප්තැම්බර් 11 ප්‍රහාරයේ පසුබිම පිලිබඳව ඔහුගේ අදහස ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තම රුදුරු දේශපාලනික අවශ්‍යතා සඳහා බුෂ් පරිපාලනය විසින් නිව් යෝර්ක් සහ වොෂින්ටන් හි ඛේදජනක මරන යොදා ගැනීමට දැරුනු උත්සාහයන් හෙලිදරව් කිරීමට මුවර් ඉතා ඍජුව ඉදිරියට යයි.

කොන්ග්‍රසයෙන් අනුමත කරන ලද එක්සත් ජනපද දේශප්‍රේමී පනත මගින්, අන්ත දක්ෂිනාංශය සහ නීති සම්පාදනය කිරීමේ ඒජන්සි මගින් දුර දිග බලා සැලසුම් කල මර්දනකාරී පියවර බොහොමයක් හඳුන්වා දුනි. සැප්තැම්බර් 11, “යමක් කිරීම සඳහා ලැබුනු

අවස්ථාවක්" යැයි ඩිමොක්‍රැටික කොන්ග්‍රස් සභික ජිම් මැක්ඩොමර්ට් සඳහන් කරයි. කොන්ග්‍රසය තුල ඩිමොක්‍රැටිකයන්ගේ පූර්න සහභාගිත්වය මත, බුෂ් පරිපාලනය පූර්න වාසිය අත් කර ගනිමින් පෙර නොවූ විරූ ප්‍රහාරයක් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මත මුදා හැරියේ ය. මුලුමනින්ම නීති ගරුක පුරවැසියන්ට එරෙහිව එෆ්බීඅයි (FBI) ය මගින් ගන්නා ලද වඩාත් විකාරරූපි පියවර සමහරක් මුවර් විස්තර කරයි. ෆැරන්හයිට් 9/11, 2003 මාර්තුවේදී ඉරාකයට එරෙහිව දියත් කල ආක්‍රමනකාරී යුද්ධයේ ආනිශංස සවිස්තරාත්මකව චිත්‍රනය කරයි: ඉරාක දරුවන්ගේ මල සිරුරු ("ඇඩි අවධානය, මනුෂ්‍යත්වය වැනි යුද්ධය දියත් කිරීමේදී අප විසින් සැලකිල්ලට ගනු ලබන දෑ යනුවෙන් රම්ස්ෆෙල්ඩ් පැවැසූ දරා ගත නොහැකි පුරසාරම් මෙමගින් කීතු කෙරේ), විනාශයට පත් වූ පවුල් මැදියම් රෑ වට ලන ලද නිවසක සිටින ත්‍රස්ත ගැන්වුනු දරුවන් සහ ගැහැනුන්.

චිත්‍රපටයෙන් ජන සංහාරක අවි සහ ඉරාක - අල් කයිඩා සබඳතා පිලිබඳ බුෂ් පරිපාලනයේ බෙගල් පැහැදිලිව හා සංක්ෂිප්තව අනාවරනය කෙරේ. යුද්ධය අනුමත කිරීම සම්බන්ධයෙන් ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වයටත්, විවේචනයකින් හෝ ප්‍රශ්න කිරීමකින් තොරව ආන්ඩුවේ බෙගල් සම්ප්‍රේෂනය කිරීම සම්බන්ධයෙන් ඇමරිකානු ජන මාධ්‍යවලටත් එය තව දුරටත් චෝදනා කරයි. ප්‍රශ්නයකින් තොරව, චිත්‍රපටයේ බලගතු ම කොටස් වන්නේ මුවර්ගේ ජන්ම නගරය වන මිචිගන්හි ෆ්ලින්ට්හි දර්ශන පෙලයි. ඔහු වඩාත් හොඳින් දන්නා තැනට අධ්‍යක්ෂවරයා ආපසු පැමිනේ. මෙහිදී චිත්‍රපටය වෙනත් ස්වභාවයක් ගන්නා අතර, එය "වාම" මධ්‍යම පන්තික විස්තර ප්‍රචාරයකට වඩා බොහෝ ඉහලට නැග ගනී. මෙහිදී තීරනාත්මක සමාජ හා පන්ති ප්‍රශ්න තියුනු සහ තර්කාන්විත ආකාරයකට මතු වේ. මෝටර් රථ කර්මාන්ත ක්ෂේත්‍රයේ දැවැන්තයා වන ජෙනරල් මෝටර්ස් සමාගමේ සේවයේ යෙදුනු දහස් ගනනක් වූ කම්කරුවන්ට වරෙක නිවහන වූ ෆ්ලින්ට් නගරයේ අද දින සැබෑ විරැකියා ප්‍රතිශතය සියයට 50 කි. එක් තරුනයකු විස්තර කලේ, රූපවාහිනියේ විකාශය කරන ලද බෝම්බවලින් විනාශ වී ගිය ඉරාක නගරයක දසුන් ඔහුගේ නිවස්න ප්‍රදේශය සිහිපත් කල බවයි. විනාශ වු නිවහන්, ව්‍යසනයට පත් වූ සහ දරිද්‍රතාවයේ ගිලුනු නිවස්නා පෙදෙස්වල දසුන් ඔහුට දරා ගත නොහැකි විය.

එක්සත් ජනපද මිලිටරියට "ස්වෙච්ඡාවෙන්" බැඳුනු තරුනයන්, වියරු සහගත වාතාවරනයන් යටතේ අධ්‍යාපනය හෝ රැකියා පුහුනුවක් ලැබීමේ බලාපොරොත්තුවෙන් තම ජීවිත අවදානමේ තැබීමට බල කෙරුනු ආර්ථික හටයින් බැව් ෆැරන්හයිට් 9/11 පෙන්වා දෙයි. එක් කලු ජාතික තරුනයින් කන්ඩායමකින්, හමුදාවේ තම නෑදැයින් සිටින්නේ කාට දැයි මුවර් විමසූ කල්හි සියලුදෙනා ම පාහේ තම අත් එසැවූහ.

වඩාත්ම විනිවිද පෙනෙන්නාවූ දර්ශනමාලාවන් අතුරින් එකක නාවික හටයන් දෙදෙනෙක් ආධුනිකයන් ලෙස බඳවා ගත හැකි අය හෝ එසේ නැතිනම් අඩුතරමේ කැමැත්ත ප්‍රකාශිතව නම් සහ ලිපින ලබා ගැනීමට රවටා ගත හැකි අය හෝ සොයමින් නගරයේ දිලිඳු ප්‍රදේශයක වෙලඳ පරිශ්‍රයක නින්දිත ලෙස බිලී බෑමේ යෙදෙති.

එමෙන්ම ඉරාකයට යවන ලද යුද හටයන්ගේ ධෛර්යය සහ මානසික තත්ත්වය සම්බන්ධයෙන් ද මුවර් ගේ අවධානය යොමුවේ. ඔහුගේ චිත්‍රය සෑහෙන තරම් සංකීර්නය: එක්සත් ජනපද හටයින් ඉරාක වැසියන් ත්‍රස්ත කරන අයුරු, සිරකරුවන් අපහරනය කරන හා ඔවුනට වධ දෙන අයුරු අපට පෙනේ. හටයින්ගේ මනෝ ව්‍යාධිමය හැසිරීමත් ප්‍රදර්ශනය කෙරේ. (වැටලීමක් සිදු කරන අවස්ථාවේ බර ලෝහමය සංගීත බන්ඩයක් ඇසෙන අතර, එක් සොල්දාදුවෙක් "එය අවසාන ප්‍රහාරය" යැයි පවසයි) මේ සියල්ල කුරිරු සහ තිරස්චීනකාරක විජිතවාදී සංග්‍රාමයක ආනිශංසයන් ය. ඒ සමගම තමා වරදක් කලේ යයි හඟිමින් ලජ්ජා වන්නවුන්, තමා සිටිනා තත්ත්වය සහ තමන්ගේම ක්‍රියාකාරකම් මෙනෙහි කරන අයුරු අපට පෙනේ. එක් තරුන සොල්දාදුවකු කැමරාවට මෙසේ කියයි. "වෙනත් ජීවිතයක් බිලි ගැනීමේදී ඔබේ ආත්මයෙන් කොටසක් විනාශ වී යයි." තවෙකකු මෙසේ කියයි. "රම්ස්ෆෙල්ඩ් මෙතන ඉන්නවානම් මම ඔහුට ඉල්ලා අස්වෙන්න කියනවා."

අත් පා අහිමි වූ දරුවන්ගෙන් පිරී ගිය, ඇමරිකානු - ඉරාකී යුද ප්‍රවීනයන්ගේ වෝල්ටර් රීඩ් වෛද්‍ය මධ්‍යස්ථානයේ බිහිසුනු දර්ශන සමග මන්දස්මිතියෙන් මුව සරසාගත් බුෂ් අරමුදල් එකතු කිරීමේ රැස්වීමක් අමතන දර්ශනයක් අන්තර් ඡේදනය වේ. ස්ථූල ශරීරවලින් යුත් ධනවතුන්ගෙන් පිරී ගිය ශාලාවේ දැවැන්ත සිනා සහ අත්පොලසන් මධ්‍යයේ බුෂ් මෙසේ කියයි: "මෙය ඇති අයගේ සහ බොහෝ ඇති අයගේ එකතුවීමක්. සමහරු ඔබට කියන්නේ ප්‍රභූව කියා. නමුත් මා ඔබට කියන්නේ මගේ පදනම කියායි."

ඉරාකය තුල ගැටුමෙන් ලාභ කඳු ගොඩ ගසා ගැනීමට බලාපොරොත්තුව සිටින කුඩා සහ සුවිසල් සංගත හිවලුන් එක් තැන් කෙරුනු සමුලුවකි. "ඩොලර් කෝටි ප්‍රකෝටි ගනනින් ලැබෙනු ඇත" යනුවෙන් දේශන මේසයේ සිට ඔවුනට මතක් කර දෙයි. එක් සහභාගිකරුවකු යුද්ධය දැකගනු ලබන්නේ "ව්‍යාපාරවලට හොඳ සහ මහජනතාවට නරක" දෙයක් ලෙසිනි.

ෆැරන්හයිට් 9/11 මගින් ඛේදජනක යථාර්ථයක් අල්ලා ගනී. ෆ්ලින්ට් හි ආර්ථික කොන්දේසි පිලිබඳ මුවර්ගේ පර්යේෂනයේ කොටසක් ලෙස ඔහු රැකියා පුහුනු කිරීමේ සහ කම්කරු බලකා සංවර්ධන

ඒජන්සියක් වන "කැරියර් අලයන්ස්" හි ලිලා ලිප්ස්කොම්බ් සමග සම්මුඛ සාකච්ඡාවක යෙදේ. තමාම විස්තර කර ගත් ආකාරයට "සම්ප්‍රදායික ඩිමොක්‍රැටිකයකු" සහ දැඩි දේශප්‍රේමියකු වන ලිප්ස් කොම්බ්ගේ පුතෙකු ඉරාකය තුල හමුදා සේවයේ යෙදී සිටී.

පලමුවෙන් හමුවන විට ඇය යුද්ධයට පූර්න සහයෝගය දෙමින් සිටි අතර නැවත හමුවන විට ඇය ඛේදවාචකයකට මුහුන දී සිටියා ය. ඉරාක ක්‍රියාන්විතය දී ඇගේ දරුවා මරා දමා තිබින. නිර්භීත සහ අවංක අයුරකින් ඇය, පෙරදී දරා සිටි අදහස්, එනම් නොසිතා වැලැඳගත් දේශප්‍රේමය සහ පරිපාලනය සම්බන්ධයෙන් තිබූ විශ්වාසය ගැන විභාග කරන්නට පටන් ගනී. යුද්ධයට රට ඇදගෙන යාමේදී ආන්ඩුවේ වංකභාවය පිලිබඳව ඇගේ අවබෝධය පුලුල් වෙමින් තිබින. ධවල මන්දිරය පිටතදී ඉරාක කාන්තා විරෝධතාකාරියක සමග වූ ලිප්ස් කොම්බ්ගේ හමුව ඉදිරිපත් කිරීම පිලිබඳව මුවර්ට චෝදනා කරන යුදවාදියකු ඇයට මුන ගැසේ. අවසාන දර්ශනයේදී, යුද්ධය හෙලා දකිමින් තම පුත්‍රයා ලියන ලද අවසන් ලියුමෙන් කොටසක් ලිප්ස් කොම්බ් කියවයි. "බුෂ්ට මොනවද වෙලා තියෙන්නේ. එයා තාත්ත වගේ වෙන්න හදනවද?" මං ඇත්තටම හිතනව, ඔවුන් මේ හාදය නැවත පත් කර ගන්න එකක් නෑ කියල." ඇගේ සැමියා අලංකාරෝක්තියෙන් මෙසේ අසයි: "ඔහු මිය ගියේ කුමක් සඳහාද? කුමක් සඳහාද?" දර්ශනය ගැඹුරින්ම කම්පාකරවන සුලුය.

අවසන් පසුබිම් කථනයෙන් පසු, සමාජ ප්‍රශ්න කෙරෙහි මුවර් බලගතු ලෙස ආපසු පැමිනේ. ධනවතුන්ට පමනක් වාසි සහගත වන යුද්ධයක නිරත වීමට කම්කරු පන්තික දරුවන්ට සිදුවීම පිලිබඳව නැවත නැවතත් ගෙන හැර පායි. බ්‍රිතාන්‍ය ජාතික වාමාංශික ලේඛකයකු වන ජෝර්ජ් ඕවෙල් උපුටා දක්වමින් ඔහු චිත්‍රපටය සමාප්තිය ගෙන එයි. "යුද්ධය යන්නෙන් අදහස් වන්නේ ජයග්‍රහනය නොවන නමුදු, ඉන් අදහස් වන්නේ නොකඩවා එය ඉදිරියට ඇදී යන බවයි... සමාජය තුල ධූරාවලියක් පැවැතිය හැකි වන්නේ දරිද්‍රතාව සහ අඥානකම යන පදනම යටතේ පමනකි. මූලධර්මයක් වසයෙන් යුද ආයාසයන් සැමවිටම සැලැසුම් කරන්නේ සමාජය හාමතේ අද්දර තැබීම සඳහා ය. පාලක කන්ඩායමක් යුද්ධය දියත් කරන්නේ තමාගේම රට වැසියාට එරෙහිව වන අතර එහි අරමුන ජයග්‍රහනය නොවෙන නමුදු, මූලික සමාජ ව්‍යූහය කිසිදු හානියකින් තොරව රැක ගැනීමයි." කෙටියෙන් පවසතොත්, වචනයෙන් නො කීවද ෆැරන්හයිට් 9/11 අවසන් වන්නේ ධනේශ්වර පද්ධතිය හා අධිරාජ්‍යවාදී යුද්ධය හරහා සමාජ ආතතීන් පාලනය කරන ආකාරය දරුනු ලෙස හෙලා දැකීමකිනි. මෙය දැවැන්ත ප්‍රේක්ෂකයන් සතු චිත්‍රපටියක් සඳහා, තව දුරටත් පැවැසුවහොත් කවර හෝ අද්‍යතන චිත්‍රපටයක් සඳහා, අත්‍යසාමාන්‍ය අමු ද්‍රව්‍යයකි. ඩොලර් මිලියන 100 ක දේශීය බොක්ස් ඔෆිස් පිරිවැටුම - මෙම සංඛ්‍යාව එහා මෙහා විය හැක. - එක්සත් ජනපදය තුල මිලියන 15 ක නරඹන්නන් සංඛ්‍යාවක් බවට පරිවර්තනය කොට ප්‍රකාශ කල හැක. ආසන්න වසයෙන් අවුරුදු 14 ට වැඩි ජනයාගෙන් සෑම 15 දෙනෙකුටම එක් අයෙකු චිත්‍රපටය නරඹා ඇත. උමතුවූ දක්ෂිනාංශිකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් චිත්‍රපටය ප්‍රදර්ශනය කරන සිනමා ශාලා අවහිර කිරීමට උත්සාහයක් දැරීම පුදුමයක් නොවේ.

හොඳින්ම කිවහොත්, දේශපාලන ප්‍රකාශනයක් අත් කර ගත යුතු ඇමරිකාව තුල වැඩෙන සමාජ කෝපය මුවර්ගේ චිත්‍රපටයෙන් ගැඹුරුවනවා පමනක් නොව එම කෝපය චිත්‍රපටයෙන් උච්චාරනය කෙරේ.

## කලාව සහ දේශපාලනය

සම්මුඛ සාකච්ඡාවල දී තමා කලා කරුවකු බවත් ප්‍රධාන සහ ප්‍රමුඛ වසයෙන් චිත්‍රපටකරුවෙකු බවත් මුවර් නැවත නැවතත් අවධාරනය කරයි. මෙය පොදුවේ අර්ථකථනය කෙරී ඇත්තේ කපටි සහ වංක අදහසක් ලෙස ය. සමහර විට මෙය, වත්මන් මැතිවරන උද්ඝෝෂනය තුල පැත්තක් ගැනීමෙන් තමාට එල්ල විය හැකි චෝදනාවලින් වැලැකී ගැනීමට ගත් උත්සාහයක් විය හැකි අතර එවන් මධ්‍යස්ථව සිටීමක් මගින් තම චිත්‍රපටයට පුලුල් ප්‍රේක්ෂකයක් ආකර්ශනය කර ගත හැකිවේ යැයි සිතුවාද විය හැක. නමුත් මෙම වාර්තා චිත්‍රපටකරුවා අවධානයකින් තොරව හෝ අවධානයකින් හෝ වැදගත් ප්‍රශ්නයක් ස්පර්ශ කොට තිබේ.

දේශපාලනඥයෙකු ලෙස හා විස්තර ප්‍රචාරකයකු ලෙස මුවර් ඛේද ජනක ලෙස වැනෙන සුලු වී ඇත. උදාහරනයක් ලෙස ඩිමොක්‍රැටිකයන්ට පිට කොන්දක් නොමැති බවට කරන හෙලා දැකීමේ සහ එහි සම්ප්‍රදායික ආධාරකරුවන්ට පක්ෂය "නැවත වැලැඳ ගන්නා" ලෙස කෙරෙන ආයාචනා අතර ඔහු දෙපැත්තට පදිමින් සිටී. සර්බියාව තුල කුරිරු ඝාතනයක් සිදු කල නැටෝ හමුදාවන් හි අන දෙන නිලධාරියා ලෙස ක්‍රියා කල හිටපු හමුදා ජනරාල් වෙස්ලි ක්ලාර්ක්ට ජනාධිපති අපේක්ෂකත්වය සඳහා මේ වසර මුලදී ඔහු දුන් සහයෝගය මුලුමනින්ම නින්දිත විය. මෙය මුවර් ගේ දුර්වලතම, වඩාත් තත්කාර්යවාදී සහ වඩාත්ම නොසිතා කල ක්‍රියාව විය.

කෙසේ නමුත්, අවංක කලාකරුවකු ලෙස මුවර්ට ඔහුගේ සවිඤ්ඤානක දේශපාලන ලෝකයේ සීමාසහිත භාවයන් ඉක්මවා යාමට බල කෙරේ. මෙය වූ කලී ඩිමොක්‍රැටික් පක්ෂයේ නායකයින්ට ආධාර හා පහසුවක් සම්පාදනය කරන චිත්‍රපටයක් නො වේ. පසුගිය සිව් වසරේ ඉතිහාසය ගවේෂනාත්මකව විභාග කිරීම තුලින්, පාලක ප්‍රභූවේ අවශ්‍යතාව මත භූගෝලීය පරිමානව එක්සත් ජනපද ආධිපත්‍යය ස්ථාපිත කිරීම

අරමුනු කර ගත් ද්වි-පාර්ශ්වීය මූලෝපායක ඩිමොක්‍රැටිකයන් දැවැන්ත ලෙස යෙදී සිටින බැව් මුවර් අනාවරනය කරයි.

ෆ්ලින්ට් සහ එවන් ප්‍රජාවන් ලෙස අවංකව බැලීමෙන්, වත්මන් ආර්ථික හා සමාජ පර්යාය තුල ඇමරිකානු කම්කරු පන්තිය තරුනයන්ට අනාගතයක් නොමැති බැව් ඇඟවීමට හෝ ඒත්තු ගැන්වීමට මුවර් තල්ලු කෙරේ. ඉන් තවත් ඈතට යමින්, අධිරාජ්‍යවාදී යුද්ධය දරිද්‍රතාවය වාසියට හරවා ගනිමින් එතුලින් තම වෙඩි උන්ඩ සොයා ගන්නා බවත්, මෙම යුද්ධය රට තුල පන්ති අරගලය මැඩීම සඳහා ආරක්ෂක කපාටයක් ලෙස යොදා ගන්නා බවත් ඒත්තු යන ආකාරයෙන් ඔහු තර්ක කරයි. මෙම ඥානයේ ඇඟැවුම් විප්ලවවාදී ය. සත්තකින්ම, දේශපාලනික හා ඓතිහාසික සිද්ධීන් සමග ඍජුවම පොර බදන නිර්මාන කෘතියකදී අවංක කලාකරුවාට පවා ඔහුගේ සීමාසහිත භාවයන් සමස්තයක් ලෙස ජයගත නො හැක. නොවිසඳුනු ගැටලු, කලාත්මක නිශ්පාදනය තුල අනිවාර්යයෙන්ම තමාගේ මග සොයා ගනු ඇත. මුවර්ගේ චිත්‍රපටයේ ප්‍රශ්නය මෙයයි.

ෆැරන්හයිට් 9/11 තුල, ෆ්ලින්ට් දර්ශන මාලාවේ සන්සුන් සහ චින්තාපරමය තානය සහ මතුපිට පමනක් ස්පර්ශ කරන, නොරිස්සුම් සහගත ලෙස විකටමය, මුලුමනින් ම පාහේ බොළඳ ක්ෂනයන් අතර ආතතියක් පවතී.

එමෙන්ම ඇමරිකානු කම්කරු පන්තිය සම්බන්ධයෙන් හට ගන්නා ගැඹුරු අනුකම්පාවත්, ඇමරිකානු මහා ව්‍යාපාරික පක්ෂ දෙකෙන් එකක් වන ඩිමොක්‍රැටික් පක්ෂයේ තුච්ඡ ලෙස සම්මුතිවාදී වූ "ලිබරල්" අංශය වෙත යොමුවූ අවස්ථාවාදී දිශානතියත් අතර තවත් ආතතියක් පවතී.

මීට අමතරව, සියලුම ආකාරයේ ජාතික හා වාර්ගික ස්වෝත්තමවාදයට විරුද්ධ සමාජවාදී ඒත්තු ගැන්වීම් සහ දේශීයවාදී අගතීන් සමග ගැලතී ගත් ඇමරිකානු ජනප්‍රියවාදී වාචාල කථා අතර පවත්නා ආතතියකි.

ක්‍රමවේදාත්මක සහ සෞන්දර්යාත්මක දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල, ෆැරන්හයිට් 9/11 චිත්‍රපටය අවසන් වන්නේ එය පටන් ගත යුතුව තිබූ තැනිනි. සවුදි අරාබිය මත සහ බුෂ් පවුලේ වාසනාව මත යෙදෙන අවධානය අතිශයෝක්තිමය නොවන අතර එම දර්ශන වඩාත් සිත් ගන්නා සුලු වේ. නමුදු, ඇමරිකාව තුල, මිචිගන් තුල දර්ශන එසේ නො වේ. ඉරාකය තුල සිදු කෙරෙන බිහිසුනු ක්‍රියා, මූලිකව ම බුෂ්ගේ පුද්ගලික කෑදරකම් හා අමනකමේ නිශ්පාදිත නො වේ. ඒවා යථාර්ථයක් වනතාක් දුරට එමගින් ප්‍රකාශයට පත් කෙරෙන්නේ සමාප්තයක් ලෙස ඇමරිකානු සමාජයේ පරස්පර විරෝධයන්ය.

අවසානයේදී, මුවර්ගේ චිත්‍රපටය තුල නොමැත්තේ, ඉරාක යුද්ධය වන් බිහිසුනු යමක් පැන නැංවිය හැකි සමාජයක හැටි ස්වභාවය පිලිබඳ බැරෑරුම්ව අවධාරිත සහ සන්තතික විශ්ලේෂනයකි. බේගල් දෙසා බාන සහ දෙන ලද ඕනෑම මොහොතක අධිරාජ්‍යවාදී ආක්‍රමනයක් සඳහා යුක්තිකරනයක් සොයා ගන්නා ප්‍රධාන දේශපාලන පෞරුෂය පිලිබඳ කරුන ද්විතීයිකය. එම ස්ථානයේ සිටින්නේ, බුෂ්, ගෝර් හෝ ජෝන් කෙරීගෙන් කවරෙකු වුව ද එක්සත් ජනපද ලෝක ආධිපත්‍යය සඳහා වන එලැඹුම ඉදිරියටම ගෙන යනු ඇත. බුෂ් ගේ පුද්ගලික යක්ෂාවේෂනය පිලිබඳ කරුන තීරනාත්මක ප්‍රශ්නය මග හැරීමේ මාධ්‍යයක් විය හැක. එම ප්‍රශ්නය නම් මුවර්ගේ චිත්‍රපටයෙන් සෑහෙන තරම් නොවලහා ඉඟි නොකෙරෙන, ඇමරිකානු ධනවාදයේ ඓතිහාසික හා පද්ධතිමය බංකොලොත්භාවය යි.

චිත්‍රපටකරුවාගේ උභතෝකෝටිකය හුදෙක් ඔහුගේ ම එකක් නො වේ. 1970 සහ 1980 ගනන්වල එක්සත් ජනපදය පුරා කම්කරු පන්තිය අත් විඳි දරුනු අත්දැකීම් තුලින් මුවර් ගේ ජීවිතය ගමන් කොට තිබින. ඔහු ඒවා අත් වින්දේ ෆ්ලින්ට් හි වැසියකු ලෙසිනි. දැවැන්ත රැකියා කප්පාදු, වෘත්තීය සමිති විසින් කම්කරුවන් ඔවුනගේ ඉරනමට ඇද දැමීම, ව්‍යසනකාරී ආර්ථික, සමාජ හා සදාචාරාත්මක ඵල විපාක මෙම අත්දැකීම් අතර වේ. එම අත්දැකීමේ සීමාසහිතභාවය සහ ඔහුගේ ම සීමාසහිත බව වෘත්තීය සමිතිවල ස්වභාවය, ඩිමොක්‍රැටික් පක්ෂයේ ස්වභාවය සහ ලිබරල්වාදයේ ඓතිහාසික භූමිකාව ඇතුලත් ඇමරිකානු කම්කරු පන්තිය මුහුන දෙන නොවිසඳුනු දේශපාලනික ගැටලු සමග බැඳී පවතී.

මෙතැන් සිට මුවර් කොතැනට ගමන් කරනු ඇතිද? අපේ දෘෂ්ටියට අනුව කලාකරුවකු ලෙස ඔහුගේ ඉදිරි පරිනාමය සුවිසල් ලෙස රඳී පවත්නේ ඔහුගේ බුද්ධිමය හා දේශපාලනික වර්ධනය මත ය. ප්‍රථම කොටම, මෙය ඔහුගේ සමාජවාදී ඒත්තු ගැනීම් සඳහා වන විවෘත වරපත්‍රයක් වනු ඇත. චිත්‍රපටකරුවාට තමාම පුනර්කරනය නොවීමට නම් හෝ පසුගාමීත්වයට වැටී ඔහු විසින් ගැඹුරින්ම ඒත්තු ගනු ලැබූ කරුනුවලට ප්‍රතිපක්ෂ වූ කරුනු සඳහා තම කාර්යය යොදා ගනු ලැබීම වලක්වා ගැනීමට නම් ඇමරිකානු ධනවාදය පිලිබඳ අවංක සහ ගැඹුරට යන විවේචනයක් අවශ්‍යම වේ.

නිසැකවම, මුවර් සෑහෙන ප්‍රමානයක් කියවා සහ සිතා මතා ඇති අතර එම පදනම යටතේ මෙම චිත්‍රපටය තුලින් ඔහු තීරනාත්මක වර්ධනයක් ද අත් කොට ගෙන ඇත. ඔහු බොහෝ දුර පැමින තිබේ. ඔහුගේ සිතුවිලි සහ ඔහුගේ කලාව තුල ඇති ආතතීන් ඔහුට විසඳාගත හැකි වේ යැයි යමෙකු බලාපොරොත්තු වේ.

© www.wsws.org